**09-01-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ප්‍රජාපිතා වූ කලී, ආදීතම මුතුන්මිත්තාය. එනම්, සියලු ආගම් හි පළමු පියාය. ඔබ දරුවන් පමණි ඔහුගේ රැකියාව තේරුම් ගෙන ඇත්තේ.

**ප්‍රශ්නය:** ඔබේ ක්‍රියා උසස් කර ගැනීමේ මාර්ගය කුමක්ද?

**පිළිතුර:** මේ උපතේ දී ඔබ සිදු කරන ලද මොනම ක්‍රියාවක්වත් පියාගෙන් වසන් නොකරන්න. සෑම ක්‍රියාවක්ම ශ්‍රීමත් අනුව කළ විට ඒවා උසස් ක්‍රියා බවට පත් වේ. සෑම දෙයක්ම රඳාපවතින්නේ ක්‍රියා මතය. යමෙක් විකර්මයක් කර සැඟවූවොත්, සිය වාරයක් දඬුවම් වැඩි වන අතර එම පාපය දිගටම වැඩි වේ. පරමාත්ම පියා සමඟ වන යෝගාවද කැඩේ. ඔවුන්ගේ පාප මෙසේ සඟවන අය ඔවුන් තුළ ඇති සත්‍යය සම්පූර්ණයෙන් විනාශ කර දමයි. සත්‍ය පියාට අවංක විය යුත්තේ මේ නිසාය.

ඕම් ශාන්ති. බොහෝ කාලයක් නැතිව සිට දැන් හමු වූ ආදරණීය සුමිහිරි දරුවන් වන ඔබ දැන් දන්නවා, සුළු දිනක් පමණයි මෙම ජරාජීර්ණ ලෝකයේ ඔබ ගමන් කරන්නේ කියා. ලෝකයේ මිනිසුන් සිතන්නේ ඔවුන් දිගටම තව අවුරුදු 40,000 ක් මේ ලෝකයේ ජීවත් වෙනවා කියාය. ඔබ දරුවන් ශ්‍රද්ධාවන්තයි. පැහැදිලි දැක්මකින් යුක්තයි. මේවා අමතක නොකරන්න. මෙහි ඉඳිත්දී ඔබ දරුවන්ට හැඟෙනවා ඇතුළත සතුට බුබුළු නඟන බව. ඇසින් දකින බාහිර සියල්ල විනාශ මුඛයට යමින් සිටී. එය දකින ජීවාත්ම සත්තාව අවිනාශීය. ඔබේ බුද්ධියේ තිබෙන්නේ ඔබ ජීවාත්ම සත්තාවන් බවත් සම්පූර්ණ උපත් 84 ගෙන ඇති බවත්ය. පරමාත්ම පියා දැන් නැවත ඔබ ආපසු ගෙදර ගෙන යාමට පැමිණ සිටී. පැරණි ලෝකය අහවර වන විට ලෝකය අළුත් කිරීමට පරම පියා පැමිණෙයි. පැරණි ලෝකය නැවත ජරාජීර්ණ වන අතර එම ජරාජීර්ණ ලෝකය අළුත් බවට පත් වේ. ඔබේ බුද්ධියේ මෙම චක්‍රය පිළිබඳ ඥානය ඇත. අනේකවාර ගණනක් ඔබ මේ චක්‍රය වටේ ගොස් ඇත. මෙම චක්‍රය දැන් අවසන් වෙමින් තිබේ. එවිට, නව ලෝකයේ ඔබ දේවතාවන් සුළු දෙනෙක් සිටිනු ඇත. එහි සාමාන්‍ය මනුෂ්‍යයින් නොසිටියි. ඔබ දැන් සාමාන්‍ය මනුෂ්‍යයින් බවින් දෙවි දේවතාවුන් බවට වෙනස් වෙයි. ඔබට මේ ගැන ස්ථිර ශ්‍රද්ධාවන්ත පැහැදිලි බවක් ඇත. හැම දෙයක්ම රඳා පවතින්නේ ක්‍රියා මතයි. මනුෂ්‍යයින් වැරදි ක්‍රියා කරන විට, ඔවුන්ගේ හෘද සාක්ෂියෙන් නියතයෙන්ම විඳවයි. මේ නිසයි පියා මෙසේ අසන්නේ ඔබ මේ උපතේ දී එවැනි ක්‍රියා කළේ නැ නේද? මෙම ලෝකය රාවණ්ගේ කිළිටු රාජධානියයි. ඔබ පමණයි මෙය තේරුම් ගන්නේ. ලෝකයේ කිසිවෙකු රාවණ් නොහඳුනයි. ගාන්ධි පියාණෝ කියමින් සිටියා ඔහුට රාම රාජ්‍යය තැනීමට අවශ්‍ය බව, නමුත්, කිසිවෙකු එහි තේරුම දැන සිටියේ නැත. මේ අසීමිත පියා දැන් ඔබට තේරුම් කරනවා රාම රාජ්‍යය කොයි ආකාරයේ ද කියා. මෙම ලෝකය නොපැහැදිලි දැක්මක් ඇත්තන්ගේ ලෝකයයි. අසීමිත පියා දැන් ඔබ දරුවන්ට දෙන්නේ ඔබේ උරුමයයි. ඔබ තව දුරටත් භක්ති ක්‍රියා කරන්නේ නැත. දැන් ඔබ පියාගේ අතින් අල්ලාගෙන ඇත. පියාගේ රැකුල නැති ඔබ විස ගඟක ගිලී සිටියා. කල්ප භාගයක් භක්තිය තිබේ. ඥානය ලැබුණු කළ ඔබ සත්‍යුග නව ලෝකයට යයි. ඔබ දරුවන්ට දැන් විශ්වාසයි බාබා සිහි කිරීමෙන් පාරිශුද්ධියට පත් වන බව. ඉනික්බිතිව ඔබ පිරිසිඳු රජදහනට යැවේ. දැන් මෙකල පමණයි, මෙම උසස්තම සංගම් යුගයේ පමණයි, ඔබ මෙම ඥානය ලබන්නේ. ඔබ මේ උසස් සංගම් යුගයේ දීයි කිලිටි බවින් සුන්දර බවටත්, කටු බවින් මල් බවටත් වෙනස් වන්නේ. ඔබට මෙසේ කර දෙන්නේ කවුද? පරමාත්ම පියාය. අප දන්නවා මේ පියා අප ජීවාත්ම සත්තාවන්ගේ අසීමිත පියා බව. ලෝකයේ පියෙකුට අසීමිත පියා යැයි කිව නොහැකිය. ජීවාත්ම සත්තාව ලෙස ගත් කල සියලු දෙනාගේම පියා වන්නේ මේ පාර ලෞකික පියාය. එවිට බ්‍රහ්මාගේ කාර්යභාරයද අවශ්‍ය වෙයි. ඔබ දරුවන් දැන් දන්නවා හැම කෙනෙකුගේම කාර්යභාරය. ඔබ දන්නවා විශ්ණුගේ කාර්යභාරයත් ඔහු එතරම්ම ප්‍රමාණයක් සරසනවා. ඔහු දෙව්ලොව මාස්ටර්ය. මොහු අයත්වන්නේ සංගම යුගයටයි. අශරීරික ලෝකය, සූක්ෂම කලාපය සහ ශාරීරික ලෝකය ආදී වශයෙන් ඇත. ඒවා ඇත්තේ සංගම යුගයේදී පමණි. පියා තේරුම් කරනවා මෙකල දැන් ඇත්තේ පැරණි ලෝකයත් නව ලෝකයත් මුණගස්වන සංගම යුගයයි. මිනිසුන් මෙසේ හඬගායි පාරිශුද්ධකරුවාණනි, වඩින්න! නව ලෝකය පාරිශුද්ධ වන අතර පරණ ලෝකය අපිරිසිඳු ලෝකයයි. ඔබ දන්නවා මෙම අසීමිත පියාට ද කොටසක් ඉටුකිරීමට ඇති බව. ඔහු නිමැවුම් කරුවා මෙන්ම අධ්‍යක්ෂ ද වෙයි. සෑම කෙනෙකුම මෙය විශ්වාස කරනා බැවින් ඔහුට නියමිත වූ යම් ක්‍රියාවක් ඇත, එසේ නොවේද? ඔහුට මනුෂ්‍යයෙක් යැයි නොකිය වෙන අතර ශරීරයක් ද නැත. අන් සියලු දෙනා එක්කෝ දෙවි දේවතාවුන්,

නැතහොත් මනුෂ්‍යයින්ය. ශිව බාබාට කියා ශරීරයක් නැති නිසා ඔහු දෙවි දේවතාවක් හෝ මනුෂ්‍යයෙක් යැයි නොකියැ වේ. ඔහු මෙම ශරීරය ණයට ගෙන ඇත්තේ තාවකාලිකවයි. ඔහුම මෙසේ කියයි මෙම ශරීරය නොමැතිව, මා ඔබ සුමිහිරි දරුවන්ට රාජයෝග උගන්වන්නේ කෙසේද? මිනිසුන් මා ගස් ගල් අතර ඇතැයි කීවත් ඔබ දරුවන් දැන් දන්නවා මා පැමිණෙන ආකාරය. ඔබ දැන් රාජයෝගා ඉගෙනගනිමින් සිටී. කිසිම මනුෂ්‍යයෙකුට මෙය ඉගැන්විය නොහැකියි. දෙවි දේවතාවුන් ස්වර්ණම යුග රාජධානිය උරුම කර ගත්තේ කෙසේද? ඔවුන් සංගම් යුගයේ දී නියතයෙන්ම රාජයෝග අධ්‍යයනය කළා. ඉතින්, මෙය මතගා බැලීමෙන් ඔබ දරුවන් විශාල සතුටක් අත්විඳිය යුතුයි. අප දැන් උපත් 84 චක්‍රය සම්පූර්ණ කර ඇත. පරම පියා සෑම චක්‍රයකදීම පැමිණෙයි. පියා මෙසේ ද කියයි මෙය බොහෝ උපත් වල අවසානයයි. සත් යුගයේ කුමරා වන ශ්‍රී ක්‍රිෂ්ණා උපත් 84 ක චක්‍රය පුරා යයි. ඔබ ශිවා පිළිබඳව උපත් 84 ක් නොපෙන්වයි. මෙය තේරුම් ගන්නා ඔබ අතරින්ද අනුපිළිවෙලින් මෙය තේරුම් ගන්නේ උත්සාහ කරන ප්‍රමාණය අනුවයි. මායා ඉතා ශක්තිමත්ය ඇය කිසිවෙක් අත නොහරියි. පියා මෙය හොඳින් දනී. පියා අන්තර්යාමී (කෙනෙකු තුළ ඇති සෑම දෙයක්ම දන්නා) යැයි නොසිතන්න නොවේ මැයි! ඔහු සෑම කෙනෙක් ගැනම දැන ගන්නේ ක්‍රියාකාරීත්වය අනුවය. මායා ඔවුන් අමුවෙන්ම ගිල දැමූ ආරංචිය ඔහුට ලැබේ. ඔබ දරුවන් නොදන්නා එවැනි බොහෝ දේ ඇත. පියා ඒ සෑම දන්නා නිසා මිනිසුන් සිතනවා බාබා අන්තර්යාමී කියා. පරම පියා මෙසේ කියයි මා අන්තර්යාමී නොවේ. හැම කෙනෙක්ම ඔවුන්ගේ හැසිරීම් අනුව දැනගත හැකිය. සමහරුන්ගේ හැසිරීම ඉතා කිලිටි සහගතය. පරමාත්ම පියා ඔබ දරුවන්ට අනතුරු අඟවයි. මායා ගැන සුපරීක්ෂාකාරී වන්න! මායාට කුමන ආකාරයෙන් හෝ ඔබව සම්පූර්ණයෙන් ගිල දැමිය හැකියි. එසේ වුවත්, පියා විස්තර කරත්දීත්, ඔවුන් එය බුද්ධියට නොගනී. මේ නිසයි ඔබ දරුවන් බොහෝ ප්‍රවේසමෙන් සුපරීක්ෂාකාරී විය යුත්තේ. කාමරාගය ලොකුම හතුරාය. ඔබ පාපයට වැටුන අවස්ථාව ඔබවත් නොදනී. ඒ නිසා එවැනි දරුවන්ට පියා කියන්නේ වරදක් කළොත් ඒ ගැන ඔබ අවංකවම පියාට කියන ලෙසයි. එය නොසඟවන්න. නැත්නම්, පාපය සිය දහස් වාරයක් එකතු වී හෘද සාක්ෂියෙන් ඇතුළතින් බැට කමින් ඔබ සම්පූර්ණයෙන්ම බිම පතිත වෙයි. ඔබ සත්‍ය පියාට සම්පූර්ණයෙන් අවංක විය යුතුව ඇත. නැත්නම් විශාල පාඩුවක් වෙයි. මෙකල මායා ඉතා නපුරුය. මේ රාවණ්ගේ ලෝකයයි. අප මේ ජරාජීර්ණ ලෝකය සිහි කරන්නේ මන්ද? අප සිහි කළ යුත්තේ ගමන අරඹා ඇති නව ලෝකය ගැනයි. පියෙක් නව නිවසක් සෑදූ විට ඔහුගේ දරුවන් ඔවුන් යන නව නිවස සතුටින් සිහිකරයි. මෙහිදී එය අසීමිත කාරණාව වෙයි. දෙව්ලොව නම් වූ නව ලෝකය සාදන්නේ අප සඳහාය. එහි නියතයෙන්ම අප වාසය සඳහා දිව්‍ය මාලිගා ඇත. අප දැන් එම නව ලෝකයට යමින් සිටී. ඔබ පියා සිහි කළ තරමට, ඔබ සුන්දර මල් බවට පත් වීම වැඩි වේ. පාපයේ බලපෑමෙන් පත් වූයේ කටු බවටය. මේ ළමුන්ගෙන් බාගයක්ම මායා සම්පූර්ණයෙන් ගිල දමා ඇතැයි පියා දනී. ඔබ දන්නවා මෙහි නොඑන ළමුන් මායාගේ පාලනය යටතේ සිටින බව. ඔවුන් පියා ආසන්නයටවත් නොඑයි. මායා මෙසේ ගිල දැමූ අය බොහෝය. මෙය ඉතා හොඳයි, ඉතා හොඳයි. මම හැම දේම කරමි. මගේ ජීවිතය යඥාවට දීමට මා සූදානම්. කොහොමනමුත්, තවදුරටත් ඔවුන් මෙහි නැත. ඔබේ සටන මායාට එරෙහිවයි. මායාට එරෙහිව යුද්ධයක් ඇත්තේ කෙසේ දැයි ලෝකයේ කිසිවෙක් නොදනී. ඔබ දරුවන්ට අන්ධකාරයෙන් ආලෝකය කරා ඒම සඳහා බාබා ඥානය නම් තෙවෙනි ඇස ලබා දී ඇත. මෙම ඥාන ඇස ලබා දෙන්නේ ජීවාත්ම සත්තාවන්ට නිසා, බාබා මෙසේ කියයි ඔබ ජීව සත්තාවක්ම ලෙස සලකන්න. අසීමිත පියා සිහි කරන්න! ඔබ භක්ති මාර්ගයේදීත් ඔහුව සිහි කරන්න පුරුදුව සිටියා. ඔබ කිව්වා ඔබ ආ විට මම ඔබට කැප වෙමි කියා. ඔබ එසේ ඔහුට කැප වන්නේ කෙසේ දැයි දැන සිටියේ නැහැ. දැන් ඔබ දන්නවා ඔබ ජීවාත්ම සත්තාවන් බවත් පියාත් ජීවාත්ම සත්තාවක් බවත්. පරමාත්ම පියාගේ උපත අලෞකික සූක්ෂම එකකි. ඔහු ඔබට ඉගැන්වීම ද කරයි. ඔබ ඔබටම මෙසේ කියා ගනී සෑම කල්පයකම අපේ පියා බවට පත් වන්නේ මේ එකම පියාමය. අප බාබා! බාබා! යැයි හඬ ගාමු. පියාද දරුවනි, දරුවනි! කියයි. ගුරුවරයා වෙමින් ඔහු අපට රාජයෝගා උගන්වයි. වෙන කිසිවෙකුට රාජයෝගා ඉගැන්විය නොහැකියි. ඔහු අපව මුළු ලොව හිමිකරුවන් කරවයි. එමනිසා, ඔබ ඔහුටම අයිති වී එවන් වූ පියා සහ ගුරුවරයාගෙන් ඉගෙනීම් ලැබිය යුතුය. ඔබ ඇතුළතින් බුබුළු දමමින් සතුටු විය යුතුය. කෙනෙක් කිලුටු බවට පත් වුවොත්, එසේ සතුටු විය නොහැකියි. ඔබ යමෙක් කෙරෙහි කොපමණ උත්සාහ කළත් ඔවුන් ඔබේ රැහැට අයිති නොවන්නා සේය. මෙහි මිනිසුන්ට බොහෝ වාසගම් ඇත! බලන්න ඔබේ වාසගමේ මහත්වය! මොහු සියල්ලන්ගෙන්ම ඉහළම කෙනාය ආදී මුතුන්මිත්තා වන බ්‍රහ්මාය. කිසිවෙකු ඔහු ගැන නොදනී. ශිව බාබා සර්ව ව්‍යාපී බව කියනවා පමණක් නොව, බ්‍රහ්මා ගැනද කිසිවෙක් නොදනී. බ්‍රහ්මා, විෂ්ණු සහ ශංකර් පිංතූර ඇත. බ්‍රහ්මා පෙන්වන්නේ සූක්ෂම කලාපයේය. ඔවුන් ඔහුගේ චරිතාපදානය කිසිසේත් තේරුම් ගෙන නැත. ඔවුන් බ්‍රහ්මා සූක්ෂම කලාපය තුළ පෙන්වයි. ඉතින්, මිනිසුන්ගේ පියා වන බ්‍රහ්මා පැමිණියේ

කොහෙන්ද? ඔහු දරුවන් සාදයිද? කිසිවෙක් කිසිවක් තේරුම් නොගනී. මිනිසුන් ප්‍රජාපිතා ගැන කතා කළත් ඔහුගේ චරිතාපදානය ගැන දන්නේ නැත. බාබා විස්තර කර දී තිබෙනවා එය ඔහුගේ රථය බවත්, මොහුගේ උපකාරය ලබා ගත්තේ මොහු බොහෝ උපත් ලැබුවාට පසුව බවත්. මේ උතුම්ම සංගම් යුගය වූ කලී ගීතාවේ කතාන්තරයයි. පාරිශුද්ධතාවය ප්‍රධානම දෙය වෙයි. ඔබ අපිරිසිඳු බවේ සිට පිරිසිඳු බවට පත් වන්නේ කෙසේ දැයි කිසිවෙක් නොදනී. මුණිවරු හා සුද්ධවන්ත මිනිසුන් කෙසේවත් මෙසේ නොකියයි ''ඔබේ ශරීරය ඇතුළු සියල්ල අමතක කරන්න. පියා සිහි කර මායාගේ බලපෑම නිසා ඔබ කළ සියලු පව් සම්පූර්ණයෙන් දවා හළු කර ගන්න.'' කිසිම ගුරුවරයෙකුට කෙදිනකවත් මෙය කිව නොහැක. මොහු බ්‍රහ්මා වන සැටි පියා විස්තර කරයි. ඔහුගේ ළමා කල, ඔහු ගැමි කොළුවෙක්. ඔහු මුල සිට අග දක්වාම උපත් 84ක් ලබා ඇත. ඒ නිසා, නව ලෝකය පැරණි වී ඇත. ඔබ දරුවන්ගේ බුද්ධියේ අගුල් දැන් විවෘත වී ඇත. ඔබට මෙය තේරුම් ගත හැකිවා මෙන්ම උකහා ගත හැකි වෙයි. දැන් ඔබ ප්‍රඥාවන්ත වී ඇත. කලින්, ඔබ ප්‍රඥාවන්ත නොවීය. ලක්ෂ්මී සහ නාරායන ප්‍රඥාවන්ත වන අතර මෙහි මිනිසුන් ප්‍රඥාවෙන් තොරය. ඔබ ඉදිරියේ ඇති පිංතූරය දෙස බලන්න. ඔවුන් පාරාදීසයේ හිමිකරුවන් නොවේද? ක්‍රිෂ්ණා දෙව්ලොව හිමිකරුවා විය. ඔහු ගැමි කොළුවෙක් වූයේ පසුවය. ඔබ දරුවන් මෙය උකහාගෙන නියතයෙන්ම පිරිසිඳු විය යුතුය. පාරිශුද්ධතාවය ප්‍රධාන වෙයි. සමහරු මෙසේ ද ලියයි බාබා, මායා මාව වැට්ටුවා. මගේ ඇස් අපරාධකාරී බවට පත් වුණා! පියා මෙසේ කියයි ඔබව ජීව සත්තාවන් බව සලකන්න. එපමණයි! අප දැන් ආපසු ගෙදර යා යුතුයි. පරමාත්ම පියා සිහිපත් කළ යුතුව ඇත. ඔබ තව ටික කලක් ඔබේ ශරීරය වෙනුවෙන් ක්‍රියා කළ යුතු අතර ඉන් පසු අපි ආපසු ගෙදර යමු. ජරාජීර්ණ ලෝකයේ විනාශය සඳහා යුද්ධය ඇති වෙයි. බලන්න එය කෙසේ ද සිදු වන්නේ කියා. ඔබේ බුද්ධිය තේරුම් ගන්නවා දැන් ඔබ දේවි දේවතාවරුන් බවට පත්වෙමින් සිටින බව. එමනිසා, නියතයෙන්ම ඔබට නව ලොවක් අවශ්‍යය. ඒ නිසයි, විනාශය නියතයෙන්ම සිදුවිය යුතු වන්නේ. ශ්‍රීමත් අනුගමනය කිරීම මඟින් අපි නව ලෝකය ස්ථාපනය කරමු. පරම පියා මෙසේ කියයි මම ඔබගේ සේවය සඳහා සිටිමි. ඔබ ඉල්ලා සිටියා, මට පැමිණ අපිරිසිඳු ඔබව පිරිසිඳු කරන්න කියා. එමනිසා, ඔබේ ඉල්ලීමට මා ආවා. මා ඔබට පෙන්වන්නේ ඉතා පහසු මඟක් මන්මනභාව්! මෙය කීවේ පරමාත්ම දෙවියන් වුවත් ඔවුන් සඳහන් කර ඇත්තේ ක්‍රිෂ්ණාගේ නමයි. ක්‍රිෂ්ණා සිටින්නේ පියාට පසුවයි. ඔහු උත්තරීතර දනව්වේ හිමිකරුවා වන අතර මොහු ලෝකයේ හිමිකරුවාය. සූක්ෂම කලාපය තුළ කිසිවක් සිදු නොවේ. සියල්ලන්ටම ප්‍රථමයෙන් සිටින්නේ ශ්‍රී ක්‍රිෂ්ණාය. සෑම කෙනෙක්ම ඔහුට සෙනෙහස දක්වයි. අන් සැවොම එන්නේ පසුවය. හැම කෙනෙකුටම දෙව්ලොව ගිය නොහැකිය. එමනිසා, සුමිහිරි දරුවනි, ඔබ ඇටමිදුළු තුළින්ම ගැඹුරු සතුටක් විඳිය යුතුයි. කෘත්‍රිම සතුටින් වැඩක් නැත. පිටතින් විවිධාකාර ළමුන් බාබා වෙත පැමිණෙයි. ඔවුන් කෙදිනකවත් කෙසේවත් පිරිසිඳුව නොසිටියි. බාබා ඉන් කෙනෙකුට මෙසේ කීවා ඔබ පාපයේ ගැලෙද්දී මෙහි එන්නේ ඇයි? ඔහු මෙසේ උත්තර දුන්නා මා මොනවා කරන්නද? මට එහි ද සිටිය නොහැක. මම හැමදාම එන්නේ යම් දවසක ඊතලය ඉලක්කයට වදියි කියාය. ඔබ නැතිව වෙන කවරෙක් මට ගැලවීම ලබා දෙයිද? ඔහු මෙහි පැමිණ වාඩි වී ඔහේ සිටින්න පුරුදු වූවා. මායා බොහෝ බලවත්. ඔහුට විශ්වාසයක් තිබුණා, බාබා ඔහුව අපිරිසිඳු බවින් පිරිසිඳු මලක් කරවයි කියා, නමුත්, ඔහු කුමක් කරන්නද? අඩු ගණනේ ඔහු කීවේ සත්‍යයයි. දැන් ඔහු වෙනසකට ලක් වී සිටිය යුතුයි. ඔහුට විශ්වාසය තිබුණේ මෙහිදී පමණක් එය සිදුවේය කියාය. මෙකල, බොහෝ නළුවන් ඇත. ඔවුන් එකිනෙකෙක්ගෙන් වෙනස් පෙනුම ඇත. පසුව, චක්‍රයක් අවසන් වූ පසු එම පෙනුමෙන්ම නැවතත් ඔබේ චරිත කොටස රඟපායි. සියලු ජීවාත්ම සත්තාවන්ගේ චරිත කොටස් නියමිත වී ඇත. සියලු නළුවන් දිගටම ඔවුන්ගේ චරිත කොටස් හරියාකාරවම ඉටු කරයි. එහි සුළු හෝ වෙනසක් තිබිය නොහැක. සියලු ජීවාත්ම සත්තාවන් අවිනාශී වන අතර ඔවුන් තුළ අවිනාශී කොටස් පටිගත වී ඇත. මේ කරුණු ඔබට විස්තර කර දිය යුතුව ඇත. ඔබට මේවා මෙතරම් විස්තර කළත් ඔබ ඒවා අමතක කරයි. අන් අයට විස්තර කර දීමට ඔබහට නොහැකියි. මෙයද නාටකයේ සිදුවිය යුත්තකි. සෑම චක්‍රයකම රජදහන ස්ථාපිත වේ. සත් යුගයට ඇතුළු වන්නේ සුළු දෙනෙක් වන අතර එයද අනුපිළිවෙලිනි. මෙහිද ඇත්තේ අනුපිළිවෙලකි. හැම කෙනෙකුටම තමා ගේ චරිත කොටස දැන ගත හැකිය; වෙන කිසිවෙකුට එය දැන ගත නොහැකියි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. සත්‍ය පියාට නිරතුරුව අවංක වන්න. පරමාත්ම පියාට සම්පූර්ණයෙන් ඔබේ කැප කිරීම කරන්න.
2. ඥානය උකහාගෙන ප්‍රඥාවන්ත වන්න. ගැඹුරු අභ්‍යන්තර සතුට පවත්වා ගන්න. ශ්‍රීමත් වලට එරෙහිව යමක් කිරීම මඟින් ඔබේ සතුට අහිමි කර නොගන්න.

**වරදානය:** ඔබ නාටකය නම් කරුණ අත්විඳීමෙන් සහ නොබැඳි නිරීක්ෂකයෙකුගේ අවධියේ නිරන්තරව රැඳී සිටීමෙන් නොසැලී සහ නිශ්චලව සිටිත්වා.
නාටකය නම් කරුණ අත්විඳින අය නොබැඳි නිරීක්ෂකයෙකුගේ අවධියේ නිරන්තරව ස්ථාවරව සිටින අතර නිරන්තර නොසැලෙන සහ නිශ්චල බව අත්විඳිති. නාටකයේ කාරණය අත්විඳින ජීවාත්ම නරක දේක නරක නොදකිනු ඇති නමුත්, යහපත පමණක් දකිනු ඇත, එනම්, ඔවුන් ස්ව යහපත උදෙසා මාර්ගයක් දකිනු ඇත. සියලු අලාභ ගිණුම් දැන් අවසන් වී ඇත. ඔබ දානපති පියාගේ දරුවන් ය; මෙය සුබ-ඵල ගෙන දෙන යුගයයි. මෙම ඥානයේ සහ ඔබේ අත්දැකීම් වල අධිකාරීත්වය භාවිත කර නොසැලෙන සහ නිශ්චල වන්න.

**පාඨය:** තම කාලය වටිනා ලෙස සලකමින් වටිනා ආකාරයකින් භාවිතා කරන අයව කිසි විටෙකත් රැවටිය නොහැක.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: මෙම අව්‍යක්ත මාසයේ, බන්ධනයෙන් නිදහස් වී ජීවන මුක්ති අවධිය අත්විඳින්න.**

දැනුමේ නිධානයන් සමඟ මුක්තියේ සහ ජීවන මුක්තියේ අවධීන් අත්විඳිය යුත්තේ මේ කාලයේදී පමණි. දුක, අසාමය සහ පාපයන්ගේ සියලු හේතු කාරණා වලින් නිදහස් වන්න. කිසියම් පාපයක් පැමිණේ නම්, ජයග්‍රාහී වන්න, පරාජය නොවන්න. සියලු නිෂ්ඵල සිතිවිලි, නිෂේධනාත්මක සිතිවිලි සහ නිෂේධනාත්මක ක්‍රියාවන්ගෙන් නිදහස් වීම ජීවන මුක්ති අවධියයි.